# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2010

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය

(අ) විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත් විකිණීමෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබූ මුළු ආදායම රු 25,334,655 ක් වුවද සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල වූ කල්බදු වාරික රු 9,970,642 ක් එම ගිණුමට ගැළපීම නිසා වර්ෂයේ ආදායම රු 15,364,013 ක් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබූ බැවින් ආදායම රු 9,970,642 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) සබරගමුව හා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාල වලින් ලබා ගන්නා ලද විශාල ප්‍රමාණයක කාර්යාල උපකරණ හා පරිගණක පිළිබඳ ස්ථාවර වත්කම් වලට අදාල ගැලපීම් සිදුකර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

නිරවුල් නොකළ පහත සඳහන් ශේෂයන් නිරීක්ෂණය විය.

| විස්තරය | කාලපරිච්ඡේදය | වටිනාකම (රු) |
|---|---|---|
| (i) වෙනත් අත්තිකාරම් | | |
| ප්‍රාග්ධන වියදම් | 1976 සිට මේ දක්වා | 40,000 |
| (ii) විශේෂ අරමුදල් | | |
| ජාතික විද්‍යා පර්යේෂණායතනය | 2008 සිට මේ දක්වා | 254,490 |
| (iii) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වියදම් | | |
| ගෙවිය යුතු ශිෂ්‍යත්ව | 2003 සිට මේ දක්වා | 9,932 |

### 1:2.3 නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය වු නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 89 වගන්තිය, 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය හා 1988 අංක 47 දරන සේවක භාරකාර අරමුදල් සංශෝධන පනතේ 16(2) වගන්තිය. | 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල හා උසස අධ්‍යාපන ආයතන විසින් ගෙවන ලද රු.මිලියන 2,783.70 ක අධ්‍යයන දීමනාවෙන් දළ වශයෙන් අර්ථසාධක අරමුදලට හා විශ්‍රාම වැටුප් අරමුදලට රු. මිලියන 417.55 ක් ද සේවා නියුක්ති භාර අරමුදලට රු.මිලියන 83.51 ක් ද වැඩිපුර ගෙවා ඇති අතර එම මුදල අය කර ගැනීමට හෝ හිලව් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ආ) | 1998 මාර්තු 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊ/1/174/11(බි) දරන හා 2002 ඔක්තෝබර් 25 දිනැති අංක බීඩී/පීඊ1/174/11දරන චක්‍රලේඛ ලිපි | මෙම චක්‍රලේඛ වලට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල නිලධාරීන්ට 2004 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 98.598 ක මුදලක් භාෂා ප්‍රවීනතා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | 2006 ජූනි 06 දිනැති අංක 876 දරන කොමිෂන් සභා චක්‍රලේඛය | අනුමත බඳවා ගැනීමේ පර්පාටියෙන් බැහැරව චක්‍රලේඛය මගින් පරිගණක යෙදුම් සහකරුවකු, කම්කරුවන් 03 ක් හා රියැදුරෙකු 2010 වර්ෂය තුල බඳවා ගෙන තිබුණි. |
| (ඈ) | 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් තිදෙනකු හා ස්ථිර කාර්යය මණ්ඩලයේ එක් නිලධාරියකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයට මුදාහැර 2010 වර්ෂය සඳහා රු.382,360 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2:1. <u>මූල්‍ය සමාලෝචනය</u>

#### 2:1:1. <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.570,337,259 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූප ඌනතාවය රු.527,176,642 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු පිළිවෙලින් රු.570,337,259 ක් හා රු.527,176,642 ක්වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂ 02 හි ඌනතාවයක් හෝ අතිරික්තයක් ඇතිවී නොතිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2007/2008, 2008/2009 හා 2009/2010 අධ්‍යයන වර්ෂවලදී විශ්වවිද්‍යාලවලට බඳවා ගත් සිසුන් සංඛ්‍යාව හා පුනරාවර්තන වියදම් වල සාරාංශයක් පහත දැක්වේ.

| | 2007/2008 | 2008/2009 | 2009/2010 |
|---|---|---|---|
| i. විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 121,421 | 130,236 | 125,284 |
| විශ්වවිද්‍යාලයට ඇතුලත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 20,069 | 20,846 | 21,547 |
| විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 17% | 16% | 17% |

| | 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| ii. දරන ලද පුනරාවර්තන වියදම (රු.'000) | 9,921,345 | 10,227,920 | 10,865,900 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 69,491 | 71,471 | 73,398 |
| එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම (රු) | 142,771 | 143,105 | 148,040 |

2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 17% ක් පමණක් විශ්වවිද්‍යාලවලට බඳවා ගෙන තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම රු.148,040 ක් වී තිබුණි.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන තිබූ පිළිවෙලින් රු.මිලියන 450 ක් හා රු.මිලියන 51.3 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබූ ඉඩම් හා ගොඩනැගිලි වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) i. 2008 සැප්තැම්බර් 01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ 763 අනුව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලමනාකරණ හා වාණිජ පාඨමාලා බුත්තල ගම්උදාව පරිශ්‍රයට ගෙනඒම සඳහා උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ එම පරිශ්‍රයේ වූ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන. 60 ක් වැය කර තිබූ අතර පසුව එම තීරණය වෙනස් කර එම පරිශ්‍රය කාර්යමණ්ඩල පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට තීරණය කර තබුණි. මෙම පරිශ්‍රයේ ඇති සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමේදී එය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම ඌන උපයෝජනය විය හැකි බව නිරීක්ෂණය වේ.

ii. කාර්යමණ්ඩල පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම තීරණය කරන ලද 2009 ඔක්තෝම්බර් 22 සිට පරීක්ෂාවට භාජනය කළ 2010 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂයකට වැඩි කාලය තුල එය පුහුණු කටයුතු සඳහා යොදාගෙන නොතිබූ බව වැඩිදුරටත් අනාවරණය විය.

(ආ) IRQUE ව්‍යාපෘතිය විසින් බුත්තල පීඨය සඳහා රු.4,710,353 ක් වැය කොට පරිගණක 50 ක් 2010 මැයි 26 දින ලබා දී තිබූ අතර එම පරිගණක වලින් 02 ක් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන තිබූ අතර, ඉතිරි පරිගණක 48 ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඇ) 2002 වර්ෂයේදී "සීඩා - සරෙක්" ව්‍යාපෘතිය වෙතින් ලද රු. මිලියන 139 ක ප්‍රදානයෙන් ඉතිරි රු.2,226,257 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදි නිශ්කාර්යව පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආධුනික කථිකාචාර්‍යයවරුන්ට පශ්චාත් උපාධි හැදැරීමට පර්යේෂණ ප්‍රදාන ලබාදෙන අතර 2010 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. 10,350,000 ක් වුවද වර්ෂය අවසානයේදී වැය කර තිබුණේ එයින් 80%ක් වූ රු. 8,273,900 ක් පමණි.

(ඉ) සුනාමි ව්‍යසනයෙන් දෙමාපියන් / භාරකරුවන් අහිමි වූ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ආරම්භ කළ සුනාමි ශිෂ්‍යත්ව අරමුදල රාජ්‍ය හා පෞද්ගලික දායක මුදල් රු 7,902,765 කින් සමන්විත විය. 2010 වර්ෂය අවසාන වන විට සුනාමි ශිෂ්‍යත්ව 71 ක් පමණක් පිරිනමා තිබූ අතර, අරමුදලෙහි රු. 4,421,338 ක ශේෂයක් නිරීක්ෂණය වුණි. එම ශිෂ්‍යත්ව පිරිනැමීමේ ක්‍රියාකාර ප්‍රතිශතය 44% ක් විය.

(ඊ) පෞද්ගලික ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම් 86 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ එම ගිණුම් වල රු 16,092,577 ක ශේෂයක් විය. මෙම අරමුදල් වලින් ගිණුම් 16 ක් පමණක් සක්‍රීයව පැවති අතර 2010 වර්ෂය තුලදී ඉන් රු 1,613,810 ක් වටිනා ශිෂ්‍යත්ව 51 ක් ලබා දී තිබුණි. ඉතිරි රු. 7,058,205 (ගිණුම් 70 ක්) කට අදාල සියලු අරමුදල් අක්‍රිය තත්වයේ පැවති අතර, වර්ෂ ගණනාවක් පැරණි මෙම ශිෂ්‍යත්ව අරමුදල් භාවිතය සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමට හෝ නිරාකරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) සංයුක්ත සැලැස්ම

(ඇ) දීමනා ගෙවීම